# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල, පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරු නාමය - අධ්‍යක්ෂ - (පරිපාලන)**
**සේවා ශ්‍රේණිය - "ජ්‍යෙෂ්ඨ කළමනාකාර"**
**පුරප්පාඩු ගණන - 01**

01.1. සුදුසුකම් :

01.1.1. බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කළමනාකරණ/ වාණිජවේදී/ මානව සම්පත් කළමනාකරණ/ රාජ්‍ය පරිපාලන යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත ආයතනයක /මණ්ඩලයක/හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**02. තනතුරු නාමය - අධ්‍යක්ෂ - (මූල්‍ය)**
**සේවා ශ්‍රේණිය - "ජ්‍යෙෂ්ඨ කළමනාකාර"**
**පුරප්පාඩු ගණන - 01**

02.1. සුදුසුකම් :

02.1.1. බාහිර අයදුම්කරුවන් : (පහත සඳහන් 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජවේදී/ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම;

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණය ආයතනයේ පූර්ණ සාමාජිකත්වය;

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**03. තනතුරු නාමය - අධ්‍යක්ෂ - (මත්ද්‍රව්‍ය නිවාරක, අධ්‍යාපන හා පුහුණු)**
**සේවා ශ්‍රේණිය - "ජ්‍යෙෂ්ඨ කළමනාකාර"**
**පුරප්පාඩු ගණන - 01**

03.1 සුදුසුකම් :

03.1.1 බාහිර අයදුම්කරුවන්;

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (ඉහත 1, 2 හා 3 හි දැක්වෙන තනතුරු සඳහා)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකාර (MM) සේවා ශ්‍රේණියෙහි I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*වැටුප් කාණ්ඩය* - HM 1-1
*වැටුප් පරිමාණය* - රු. 80,295 - 15 x 2,270 - රු. 114,345/-
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

*වයස* : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

**04. තනතුරු නාමය - සහකාර අධ්‍යක්ෂ - (පර්යේෂණ)**
**සේවා ගණය - "කළමනාකාර"**
**පුරප්පාඩු ගණන - 01**

04.1. සුදුසුකම් :

04.1.1. බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව / සමාජවැඩ/ සංඛ්‍යානය/ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**05. තනතුරු නාමය - සහකාර අධ්‍යක්ෂ - (ප්‍රතිකාර හා පුනරුත්ථාපන)**
**සේවා ගණය - "කළමනාකාර"**
**පුරප්පාඩු ගණන - 01**

05.1 සුදුසුකම් :

05.1.1 බාහිර අයදුම්කරුවන් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝවිද්‍යාව / අපරාධ විද්‍යාව / සමාජවැඩ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (ඉහත 4 සහ 5 හි දැක්වෙන තනතුරු සඳහා)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි කනිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක II වන ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වැටුප් කාණ්ඩය - MM 1-1
වැටුප් පරිමාණය - රු. 53,175- 10 x 1,375 - 15 x 1,910 - රු. 95,575/-
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

*වයස* : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපායි.

*වෙනත්* :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය* -

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත යොමු කළ යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමවේදය* -

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරග විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

*පත්වීමේ ස්වාභාවය* -

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

*අයදුම්පත් ගාස්තුව* -

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම තැපැල් කාර්යාලයක් වෙතින් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමට ලියන ලද සාමාන්‍ය මුදල් ඇණවුමක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එහි ගෙවීම් කාර්යාලය ලෙස "රාජගිරිය තැපැල් කාර්යාලය" සඳහන් කළ යුතුය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

ඔබගේ තොරතුරු " A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම් පස කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ 2020.11.13 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

**අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් ඇණවුම අමුණා නොමැති අයදුම්පත් / ආදර්ශ අයදුම්පත නොමැති හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

සභාපති,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

383, කෝට්ටේ පාර,
රාජගිරිය.

ප්‍රකාශිත දිනය : 2020.10.23